## 2. සංකල්ප හා අර්ථ දැක්වීම

### 2.1ආර්ථික සංගණනය

ශ්‍රී ලංකාවේ දේශසීමාව තුළ ක්‍රියාත්මක වන සියළුම ආර්ථික කටයුතු වල නියුතු ඒකකයන් ආවරණය වන පරිදි නියම කරනු ලබන කාලසීමාවක් තුළ කෘෂිකර්ම, කර්මාන්ත, වෙළෙඳ හා සේවා කටයුතු වල තොරතුරු රැස් කිරීම, ගොනු කිරීම, ඇගයීම, විශ්ලේෂණය කිරීම හා ප්‍රකාශයට පත් කිරීමේ හෝ බෙදාහැරීමේ සම්පූර්ණ ක්‍රියාවලිය ‘‘ආර්ථික සංගණනය’’ ලෙස හැඳින් වේ.

### 2. 2ආර්ථික සංගණනයේ කෘෂිකාර්මික කටයුතු පිළිබඳ ගණන් ගැනීම

තොරතුරු එක්රැස් කිරීමේ ඒකකය ලෙස ගොවි කාණ්ඩය පදනම්ව, කෘෂිකාර්මික ව්‍යුහයට අදාල ප්‍රමාණාත්මක තොරතුරු එක් වගා වර්ෂයක් තුළ දී රාජ්‍ය අනුග්‍රහය සහිතව දීපව්‍යාප්තව එක්රැස් කිරීමේ ක්‍රියාවලිය ‘‘කෘෂිකාර්මික කටයුතු පිළිබඳ ගණන් ගැනීම’’ ලෙස හැඳින්වේ.

### 2. 3“වත්ත”අර්ථ දැක්වීම

**එකම කාරක තත්ත්වයක් යටතේ හා එකම භුක්තියක් යටතේ වන භූමි ප්‍රමාණයකින් අවම වශයෙන් එක් බිම් කැබැල්ලක්වත් අක්කර 20 ක් හෝ ඊට වඩා වැඩි වන්නේ නම් එම ගොවි කාණ්ඩය වත්තක් ලෙස සලකනු ලැබේ. මෙහිදී වත්තේ සේවය කරනු ලබන කම්කරුවන්ගේ ප්‍රමාණය පිළිබඳව  සැලකිල්ලට ගනු නොලැබේ.**

එකම කාරකත්වය, එකම භුක්තිය යන සංකල්ප පහත පැහැදිලි කොට ඇත.

**I. එකම කාරකත්වය**

වත්ත යන්න නිර්වචනය කිරීමේදී කාරක තත්ත්වයට විශේෂ ස්ථානයක් හිමිවන අතර වතු ඇසුරින් ප්‍රධාන වශයෙන්ම කාරක තත්ත්වයන් 4 ක් හඳුනාගත හැකිය. එනම්,

- තමා විසින්ම වත්තේ වැඩ කටයුතු මෙහෙයවන පුද්ගලයන්
- රජයේ ආයතනයක්, වෙළෙඳ සමාගමක් හෝ කළමණාකරණ නියෝජිත ආයතනයක් වෙනුවෙන් වැඩ කටයුතු මෙහෙයවන අධිකාරී, කොන්දොස්තර වැනි වැටුප් ලබන සේවකයන්
- පුද්ගලික අයෙකු හෝ පිරිසක් වෙනුවෙන් වත්තේ වැඩකටයුතු මෙහෙයවන පුද්ගලයන්
- තවත් හවුල්කරුවන් සමඟ වත්තේ වැඩ කටයුතු මෙහෙයවන පුද්ගලයන්

වත්තක් වීම සඳහා ඉහත සඳහන් කරන ලද කාරක තත්ත්වයන් ඇසුරින් **එකම කාරක තත්ත්වයක** එම වත්ත හෝ එහි කොටස් පැවතිය යුතුය.

**II. එකම භුක්තිය**

යම් පුද්ගලයෙකුට හෝ ආයතනයකට භූමිය අයිතිව ඇති අවස්ථාවක එම පුද්ගලයා හෝ ආයතනය මෙන්ම වෙනත් පුද්ගලයකු හෝ ආයතනයක් එම භූමිය තුළ වගා කටයුතු සත්ව

පාලන කටයුතු කරමින් එහි අස්වැන්න හෝ නිෂ්පාදනය ලබාගනී නම් එය එම භූමිය භුක්ති විඳීම වන අතර එය භුක්තිය ලෙස හඳුන්වයි.

වත්තක් තුළදී මෙම භුක්තිය ප්‍රධාන වශයෙන් ස්වරූප 6 ක් යටතේ හඳුනාගනු ලැබීය. එනම්,

**රජයේ**

අමාත්‍යාංශයකට හෝ දෙපාර්තමේන්තුවකට අයිතිව ඇති ඔවුන් විසින් වගාව නඩත්තු කරන වතු , රජයේ වතු ලෙස හැඳින්වේ.

උදා: කෘෂිකර්ම අමාත්‍යාංශයට අයිති වතු, ශ්‍රීලංකා යුධ හමුදාවට අයිති වතු

**අර්ධ රජයේ**

අයිතිය අර්ධ රාජ්‍ය ආයතන සතුව පවතින වතු අර්ධ රජයේ වතු ලෙස හැඳින්වේ.

උදා: තේ පර්යේෂණායතනය, රබර් පර්යේෂණායතනය, ජන වසම, හලාවත වැවිලි සමාගම, කුරුණෑගල ප්ලාන්ටේෂන්ස්

**වැවිලි සමාගම්**

1992 වසරේදී ක්‍රියාත්මක වූ රාජ්‍ය වතු පෞද්ගලීකරණ වැඩසටහන යටතේ බදු දී ඇති ආයතන වැවිලි සමාගම් සතු වතු ලෙස හැඳින්වේ.

උදා:බොගවන්තලාව ප්ලාන්ටේෂන්ස්, බලංගොඩ ප්ලාන්ටේෂන්ස්, හපුගස්තැන්න ප්ලාන්ටේන්ස්

**පුද්ගලික සමාගම්**

පුද්ගලයින් දෙදෙනෙකු හෝ ඊට වැඩි පිරිසක් එකතු වී, සමාගම් නීතිය යටතේ ලියාපදිංචි කොට ඇති ඔවුන් සතු වතු පුද්ගලික සමාගම් සතු වතු ලෙස හැඳින්වේ.

උදා: හැටන් ප්ලාන්ටේෂන් පුද්ගලික සමාගම, කැලණිවැලි ප්ලාන්ටේෂන්ස් (හේලීස්)

**තනි පුද්ගල**

කිසියම් තනි පුද්ගලයෙකු සතු වතු පුද්ගලික තනි වතු ලෙස හැඳින්වේ.

**පුද්ගලික හවුල්**

පුද්ගලයින් දෙදෙනෙකු හෝ ඊට වැඩි පුද්ගලයින් සංඛ්‍යාවක් විසින් හවුල් අයිතිය ඇතිව නඩත්තු කරනු වතු පුද්ගලික වතු ලෙස හැඳින්වේ.

භුක්තිය කවර ආකාර වුවද ආර්ථික සංගණනයේ වතු නිර්වචනයට අනුව වත්තක් වීම සඳහා වත්තක සියළුම කොටස් **එකම භුක්තියක්** යටතේ විය යුතුය.

## 2.4 "උපකොටස" අර්ථ දැක්වීම

ගොවිකාණ්ඩයක් බිම් කැබලි කිහිපයකින් සමන්විත වන අවස්ථාවකදී එම බිම් කැබලි එකිනෙකට යාබද නොවන අයුරින් පිහිටිය හැක. එවැනි අවස්ථාවක එම කැබලි අතර අක්කර 20 ට වැඩි කැබලි මෙන්ම අක්කර 20 ට අඩු කැබලිද තිබිය හැක. මෙම කැබලි උපකොටස් ලෙස වෙන්කොට ඇත්නම් පමණක් ඒ අතර ඇති අක්කර 20 ට අඩු කැබලි වතු උපකොටස් ලෙස හඳුන්වන අතර එසේ උපකොටස් ලෙස නම්කර නොමැති එවැනි බිම් කොටස් වතු උපකොටස් ලෙස නොසැලකේ.

## 2.5 ගොවිකාරකය

පහතින් දැක්වෙන ක්ෂේත්‍ර පිළිබඳ වගකීම් දරමින් එකී කටයුතු එකක් හෝ කිහිපයක් සම්බන්ධව ගොවි කාණ්ඩය තුළ ප්‍රධාන තීරණ ගන්නා තැනැත්තා "ගොවි කාරකයා" වේ.

- කෘෂිකාර්මික බෝග වගා කිරීම
- මස්, කිරි හෝ බිත්තර නිෂ්පාදනය සඳහා සතුන් ඇති කිරීම
- මිරිදිය/ කිවුල්දිය (කලපු) / කරදිය මසුන් බෝ කිරීම හෝ වගා කිරීම

මෙහිදී ඔහු / ඇය ඉහත කටයුත්තක් හෝ කටයුතු

- තමා විසින් කරන්නකු හෝ
- අන් අයගේ සහාය ඇතිව කරන්නකු හෝ
- එම කටයුතු වලට අදාලව කායික වැඩක් නොකර මෙහෙයවමින් තීරණ ගන්නා තැනැත්තෙකු හෝ විය හැකිය.

ගොවි කාරකයෙක් ස්වකීය වගා කටයුතු /සත්ව පාලනය/ජල ජීවී වගාවන් වෙන් වෙන් වශයෙන් හෝ සියල්ලම හෝ තමාම කරන්නකු විය හැකි ය. එසේත් නැතිව කෘෂිකර්මයට අදාළ කායිකව වැඩ නොකර එම කටයුතු මෙහෙයවන්නෙකු පමණක් ද විය හැකිය. තවද ඔහු ඉඩම් හෝ කෘෂිකාර්මික සතුන් හෝ ජල ජීවී වගාවන් අයිතිකරුවකු හෝ නොවිය හැකි ය. එනම් හිමිකම කාරකත්වය සඳහා සුදුසුකමක් නොවේ.

කෘෂිකාර්මික සතුන් ඇති කිරීමේදී එම සත්ව පාලනයේ වගකීම භාරව වැඩ කරන්නා ගොවි කාරකයෙකු වේ. එම සතුන් ඔහුට අයිති විය හැකි ය. නැතහොත් කුලියට හෝ බද්දට හෝ අන්ක්‍රමයකට ගෙන ඇති කරනවා විය හැකි ය.

ගොවිකාරකයකු වීමට ඔහු තම ශ්‍රමය යොදා ඉඩම් වගා කිරීම, කෘෂිකාර්මික සතුන්ගේ (කිරි දෙවීම,තණ කැවීම වැනි) එදිනෙදා කටයුතු, ජල ජීවී වගාව ආශ්‍රිත එදිනෙදා කටයුතුවල නියැලී සිටීම අවශ්‍ය නොවේ. ඉඩම් වගා කිරීම, සතුන් ඇති කිරීම, ජල ජීවී වගා කටයුතු යන අංශ එකක හෝ කිහිපයක එදිනෙදා තීරණ ගැනීම ප්‍රමාණවත් වේ.

ගොවි කාණ්ඩයේ ප්‍රධානියා වන්නේ "ගොවි කාරකයා" ය. කෘෂිකාර්මික කටයුතු මෙහෙයවීම පිළිබඳ ප්‍රධාන ආර්ථික හා තාක්ෂණික වගකීම ඔහු සතු ය.

## 2.6 බිම් කැබැල්ල

ගොවි කාණ්ඩයට අයත් බිම් කොටසක්, එම ගොවි කාණ්ඩයට අයත් නොවූ බිමකින්, ජල මාර්ගයකින්, පාරකින්, කැලෑවකින් සම්පූර්ණයෙන් ම මායිම්ව ඇත්නම් එය"බිම් කැබැල්ලක්" වේ.

එකම භුක්තිය යටතේ එකිනෙකට යාව පිහිටි බිම් කොටස් කිහිපයක් එකම කැබැල්ලක් ලෙස සැලකේ.